# සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය



**විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය**

ශ්‍රේණිය : 6 ශ්‍රේණිය
වාරය : දෙවන වාරය

ඒකකය : කලා වැවට පින් දීලා පලයල්ලා

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

ඉගෙනුම් පල

- නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි.
- වැව හා බැඳුණු සංස්කෘතික තොරතුරු රැස් කරයි.
- වැව හා බැඳුණු සංස්කෘතික උරුමය සම්බන්ධ දැනුම නිර්මාණ කාර්යයේ දී හා අධ්‍යයන කටයුතුවලදී යොදා ගනියි.
- වැව හා බැඳුණු සංස්කෘතිය අගය කරයි.

## 1. හිස්තැනට සුදුසු පිළිතුර කොටුව තුළින් තෝරන්න.

ගොවිතැන ...................... කරගත් ලාංකික ජනයාට ජලය ඒ සඳහා අත්‍යවශ්‍ය විය. වැසි දිය පමණක් ඊට ප්‍රමාණවත් නොවී ය. වැව් නිර්මාණය වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වැව යනු ලාංකික අපට ම ...................... වූ වාරි තාක්ෂණික අංගයකි. ...................... නමැති ඉංග්‍රීසි ජාතිකයා විසින් රචනා කළ The Seeing Ceylon කෘතිය ...................... නමින් ...................... මහතා විසින් සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත.

| |
|---|
| බ්‍රෝහියර් දුටු ලංකාව |
| ජීවනෝපාය |
| අභය හේවාවසම් |
| ආවේණික |
| ආර්.එල්. බ්‍රෝහියර් |

## 2. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

### I කඩවර ජීවත් වූයේ,

(අ) අනුරාධපුර
(ආ) පොලොන්නරුව
(ඇ) කතරගම
(ඈ) හම්බන්තොට

### II කඩවර වනයට ගොස් ජීවත් වූයේ,

(අ) භාවනා කිරීමට අවශ්‍ය වූ නිසා
(ආ) සිත කලකිරුණු නිසා
(ඇ) බිරිඳගෙ කෙනෙහිලිකම්වලින් බේරීමට
(ඈ) රජතුමාගෙන් සැඟව සිටීමට

### III කැලේ ජීවත් වූ කඩවර පිළිබඳව රජතුමාට දන්වා සිටියේ,

(අ) සෙබළු
(ආ) ඇමතිවරයෙක්
(ඇ) උයන්පල්ලා
(ඈ) මස්වැද්දා

### IV කඩවරට රජතුමා පැවරූ කාර්යය වනුයේ,

(අ) මාළිගයේ සෙබලලෙක් ලෙස සේවය කිරීම
(ආ) වැව රැක බලා ගැනීම
(ඇ) කැලය රැක බලා ගැනීම
(ඈ) වැව සකස් කිරීම

**V කලා සහ බලලු වැව යන වැව් යුගල එක කර ජලාශයක් ඉදි කළ රජතුමා වනුයේ,**

(අ) ධාතුසේන රජතුමා
(ආ) වළගම්බා රජතුමා
(ඇ) මහා පරාක්‍රමබාහු රජතුමා
(ඈ) අග්බෝ රජතුමා

## 3. අර්ථය ගැළපෙන සේ යා කරන්න.

| අ | ආ |
|---|---|
| ගොන්නකින් | අතීත ජනයා |
| කෙනෙහිලිකම් | වැව් දෙක |
| වැව් යුගල | විශාල ප්‍රමාණයකින් |
| පුවත | කරදර |
| පැරැන්නෝ | ප්‍රවෘත්තිය |

## 4. හිස්තැනට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා යොදන්න

I වැවේ ජලය ඇළ මාර්ගවලට නිකුත් කිරීමට ............................... නිර්මාණය කර ඇත.

II ............................... මඟින් රළ පහරට වැව් බැම්ම සේදී යෑම වැළකේ.

III වැවක අතිරික්ත ජලය පිට කරන ස්ථානය............................... යි.

IV වැවට බාහිරින් සපයන ජලය ............................... හරහා වැවට ලබා ගැනීම සිදු කරයි.

V පීඩනයෙන් වැඩි ජල කඳක් සොරොව්වකින් පමණක් පිටතට ගැනීමේ දී සිදුවන හානිය වැළැක්වීමට ............................... නිර්මාණය කර ඇත.

බිසෝකොටුව
ඇතුළු වාන
සොරොව්ව
පිටවාන
රළපනාව

## 5. හිස්තැනට සුදුසු වචනය යොදන්න.

I රචනාව ආරම්භයට පෙර ...................... සකසා ගත යුතු ය.

II රචනාවක දී රසවත් ...................... ගැනීම වැදගත් ය.

III රචනාව සංවිධානයේ දී ප්‍රවේශය , මධ්‍ය හෙවත් ස්කන්ධය, . . . . . . . . . . . . . . . . . . . . . . . . . යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

IV ප්‍රධාන කරුණු යටතේ ...................... තීරණය කළ යුතු ය.

V රචනාව අවසානයේ මුලින් දැක්වූ කරුණුවල ...................... ඉදිරිපත් කළ හැකි ය.

| ඡේද | ප්‍රවේශයක් | සම්පිණ්ඩනයක් | රචනා සැකිල්ල | අවසානය |
|---|---|---|---|---|

## 6. "වැව හා ගොවිතැන අතර ඇත්තේ සමීප සබඳතාවකි" යන මාතෘකාව යටතේ වචන 125 කට නො අඩු රචනයක් ලියන්න.

**කලා වැවට පින් දීලා පලයල්ලා**

**පිළිතුරු පත්‍රය**

**1.**

ගොවිතැන **<u>ජීවනෝපාය</u>** කරගත් ලාංකික ජනයාට ජලය ඒ සඳහා අත්‍යවශ්‍ය විය. වැසි දිය පමණක් ඊට ප්‍රමාණවත් නොවී ය. වැව් නිර්මාණය වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වැව යනු ලාංකික අපට ම **<u>ආවේණික</u>** වූ වාරි තාක්ෂණික අංගයකි. **<u>ආර්.එල්. බ්‍රෝහියර්</u>** නමැති ඉංග්‍රීසි ජාතිකයා විසින් රචනා කළ The Seeing Ceylon කෘතිය **<u>බ්‍රෝහියර් දුටු ලංකාව</u>** නමින් **<u>අභය හේවාවසම්</u>** මහතා විසින් සිංහල භාෂාවට පරිවර්තනය කර ඇත.

**2.**

I. (අ)
II. (ඈ)
III. (ඈ)
IV. (ආ)
V. (අ)

**3.**

| අ | ආ |
| --- | --- |
| ගොන්නකින් | අතීත ජනයා |
| කෙනෙහිලිකම් | වැව් දෙක |
| වැව් යුගල | විශාල ප්‍රමාණයකින් |
| පුවත | කරදර |
| පැරැන්නෝ | ප්‍රවෘත්තිය |



**4.**

I. සොරොව්ව
II. රළපනාව
III. පිටවාන
IV. ඇතුළු වාන
V. බිසෝකොටුව

**5.**

I. රචනා සැකිල්ල
II. ප්‍රවේශයක්
III. අවසානය
IV. ඡේද
V. සම්පිණ්ඩනයක්

**6.**

**රචනාවක දී සැලකිලිමත් විය යුතු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් අදාළ මාතෘකාව යටතේ වචන 150කට නො අඩු රචනාවක් ලිවිය යුතු ය.**